**ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 10 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 237.14 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 226.80 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 10.34 ක් හෙවත් සියයට 4.36 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 139.35 | 131.70 | 7.65 | 5.49 |
| මූලධන | 97.79 | 95.10 | 2.69 | 2.75 |
| එකතුව | 237.14 | 226.80 | 10.34 | 4.36 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 20401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.50 | 4.50 | 2.50 | 3.26 | 18.00 | 9.72 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 2 ක 2016 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල ශේෂවල එකතුව රු.12,200 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0002/0169/000 | 5,000 |
| 6000/0000/00/0013/0124/000 | 7,200 |
| | 12,200 |

## 2.4 විගණන නිරීක්ෂණය

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 විසර්ජන ගිණුම

වැය විෂයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 19 සිට සියයට 49 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 20401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 86,931 ක් වූ අතර, වර්ෂ 17 ක සිට වර්ෂ 27 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3.3 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.3.1 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 06 දිනැති අංක ඩී.එම්.ඒ. 2009 (i) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව කාර්තුවකට එක් වරක් බැගින් අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදි දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

### 3.3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2017 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුව වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

දෙපාර්තමේන්තුව සතුව වාහන 4 ක් තිබුණද, රියදුරන් දෙදෙනෙක් පමණක් සිටීම නිසා වාහන පූර්ණකාලීනව ධාවනය කරවීමේ දුෂ්කරතා පැවැතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-----------------------------------------

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2017 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව සතු පුස්තකාල පොත් සම්බන්ධ සමීක්ෂණ කටයුතු 2017 ජූනි 30 දින වන විටත් සිදු කර නොතිබුණි.

**3.5 කාර්යසාධනය**

-----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**3.5.1 සැලැසුම් කිරීම**

-----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත ඉලක්ක ලඟාකර නොගත් අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| කාර්යය | කාර්යසාධන දර්ශන (KPI) | ලඟා කරගත් ඉලක්කය |
|---|---|---|
| හින්දු ආගමික ග්‍රන්ථ මුද්‍රණය සහ බෙදාහැරීම. | පෙළ පොත් 25,000 ක් මුද්‍රණය හා බෙදාහැරීම. | පෙළපොත් 12,872 ක් මුද්‍රණය කර ඇත. |
| හින්දු තරුණ ප්‍රජාව සඳහා නායකත්ව පුහුණු වැඩ සටහන් පැවැත්වීම | තරුණ ප්‍රජාව 200 දෙනෙකු පුහුණු කිරීම. | තරුණ ප්‍රජාව 119 ක් පමණක් පුහුණුවී ඇත. |
| හින්දු සංස්කෘතිය පිළිබඳ පන්ති පැවැත්වීම | සිසුන් 100 සඳහා පංති පැවැත්වීම. | සිසුන් 16 ක් පමණක් සහභාගී වී ඇත. |

**3.6 පාඩු හා හානි**

----------------

2008 වර්ෂයේ සිදුකළ භාණ්ඩ සමීක්ෂණය මගින් හඳුනාගෙන තිබු වටිනාකම නිශ්චය කිරීමට නොහැකි නැති වු පුස්තකාල පොත් 350 සම්බන්ධව මුදල් රෙගුලාසි 101 හා 102 පරිදි පරීක්ෂණ සිදු කර නොතිබුණි.

## 3.7 කළමනාකරණ දුර්වලතා

### 3.7.1 හින්දු කෝවිල් සඳහා ආධාර ලබාදීම

කෝවිල් සඳහා මූල්‍ය ආධාර ලබාදීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද ආධාර ලබාදිය යුතු කෝවිල් හඳුනා ගැනීම සඳහා වැඩ පිළිවෙලක් අනුගමනය කර නොතිබූ අතර කෝවිල්වලින් ලැබෙන ඉල්ලීම් පදනම් කරගෙන ආධාර මුදල් ලබාදී තිබුණි.

## 3.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 05 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 154 | 128 | 26 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 23 | 16 | 07 |
| | එකතුව | 184 | 149 | 35 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ, ද්විතියික හා ප්‍රාථමික මට්ටම්වල පවතින පුරප්පාඩු 09 ක් ආසන්න වර්ෂ 3 කදී නොවෙනස්ව පැවති අතර එම පුරප්පාඩු අනුව සේවකයන් බඳවා ගැනීමට හෝ එවැනි බඳවා ගැනීම් අවශ්‍ය නොවන්නේ නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට හෝ දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.